# ගිවිසුම

..........................................පදිංචි (මෙහි මින්මතු "පුහුණුව ලබන්නා" යනුවෙන් හැඳින්වෙන)....................................එක් පක්ෂයකටද, මෙහි මින්මතු සමුපකාර සමිතිය යනුවෙන් හැඳින්වෙන ලියාපදිංචි අංක.................හා ............................දින දරණ සීමාසහිත....................................සමුපකාර සමිතිය අනිත් පක්ෂයකට ඇතිව වර්ෂ එක් දහස් නවසිය.........................ක් වූ............මස................දී වන මෙදින.................................දී ඇතිකර ගන්නා ලද ගිවිසුමයි.පුහුණුව ලබන්නා ඉහතකී සමුපකාර සමිතියේ සේවකයෙකු වශයෙන් සේවය කරන හෙයින්ද, 19..........ක් වූ...........මස...............දින සිට 19...........ක් වූ...........මස...........දින දකිවා කාලය තුළ..........................මඟින් හිදී පවත්වනු ලබන සමුපකාර සේවකයින් සඳහා වන අභ්‍යාස පාඨමාලාව හැදෑරීමට එකී පුහුණුව ලබන්නා තෝරාගෙන තිබෙන හෙයින්ද, පුහුණුව ලබන්නා මෙකී මින්මතු සඳහන් කරුණු හා කොන්දේසි අනුව කටයුතු කිරීමට එකඟව සිටින බැවින්ද,

**දැන් මෙසේ අත්සන් කරදෙන ගිවිසුමෙහි වගහැටි නම් :-**

1. පුහුණුව ලබන්නා එකී පාඨමාලාව හදාරණ කාලය තුළ අවංකවත්, අනලස්වත් එකී පාඨමාලාව හැදෑරිය යුතුය.

2. පුහුණුව ලබන්නා එකී පාඨමාලාව හදාරා සමුපකාර සමිතියේ සේවයට නැවත පැමිණි දින සිට....................වර්ෂය අඩු නොවන කාලයක් එකී සමුපකාර සමිතයේ සේවයේ යෙදෙන ලෙස එකී සමුපකාර සමිතිය විසින් නියම කරනු ලැබුවහොත් සමුපකාර සමිතියක සේවකයෙකු වශයේන් ඔහු විසින් කළයුතු සියළුම කටයුතු හා ඉටුකළ යුතු සියළුම යුතුකම් කාර්යක්ෂම ලෙස කළයුතු වේ.

3. එකී පාඨමාලාව හදාරන කාලයේදී ද නැවත සේවය සඳහා එකී සමුපකාර සමිතියට පැමිණි විටද එකලට බලපවත්නා වැටුප් ක්‍රමය අනුව වැටුප් ලැබීමට පුහුණුව ලබන්නාට හිමිකම් ඇත.

4. එකී පාඨමාලාව හදාරණ කාලය තුළ පුහුණුව ලබන්නාට වැටුප් සහිත නිවාඩු දෙනු ලැබේ.එසේ වුවද යම් අත්‍යාවශ්‍ය අවස්ථාවන්හිදී එකී සමුපකාර සමිතිය එකී පුහුණුවන්නාගේ සේවය අවශ්‍ය බව ඔහුට දැන්වුවහොත් ඔහු විසින් සමුපකාර සමිතියට හෝ එම සමුපකාර සමිතිය විසින් නියෝග කරනු ලබන වෙනත් ස්ථානයකට පැමිණ එම සේවය ඉටු කළයුතුය.

   පුහුණුවන්නා විසින් පාඨමාලව හැදෑරීමට අදාල කටයුත්තක් සඳහා හෝ සමුපකාර සමිතිය වෙනුවෙන් හෝ නිරත නොවී පාඨමාලාව හැදෑරිය යුතු කාලය තුළ පාඨමාලාව හැදෑරීමෙන් බැහැරව සිටී නම් එසේ බැහැරව සිටි කාලය ගණන් බලා ඔහුගේ නිවාඩු වලින් අඩුකරනු ලැබේ

5. එකී පුහුණුව ලබන්නාගේ නොසැළකිල්ල හෝ ඔහුට නියමිත ඒ පංතිවලට නොපැමිණීම හා / හෝ නියමිත යුතුකම් ඉටු නොකිරීම නිසා හෝ අලසකම නිසා හෝ අකීකරුකම නිසා හෝ විෂමාචාරය නිසා හෝ මේ ගිවිසුම යටතේ පුහුණුව ලබන්නාට දී ඇති වරප්‍රසාද අහිමි කිරීමට සමුපකාර සමිතියට බලය තිබේ.එකී පුහුණුව ලබන්නාට දී තිබෙන වරප්‍රසාද මේ වගන්තිය යටතේ අහිමි කරනු ලැබුවහොත් හෝ පාඨමාලාව හදාරන කාලය තුළදී පුහුණුව ලබන්නා අස්වුවහොත් හෝ එසේ වරප්‍රසාද අහිමි කරන නැතහොත් ඉල්ලා අස්වන දිනය තෙක් පාඨමාලාව හදාරන කාලය තුළ තමාට ගෙවන ලද වැටුප් හා අනිකුත් සියළුම මුදල් ද, වන්දි මුදල් ද එකී පුහුණුව ලබන්නා විසින් සමුපකාර සමිතියට ගෙවිය යුතුය.

6. මේ ගිවිසුමේ දෙවන වගන්තියේ සඳහන් කරන ලද පරිදි එකී සමුපකාර සමිතියට සේවය කිරීම එකී පුහුණුව ලබන්නාට නියම කළවිට එසේ සේවය කිරීමට ඔහු අසමත් වුවහොත් හෝ පාඨමාලාව හදාරා එකී සමුපකාර සමිතියේ සේවයට පැමිණි වර්ෂය.................ගතවීමට ප්‍රථම ඉල්ලා අස්වීමෙන් හෝ වෙනත් අන්දමකින් හෝ අවසරයක් නොමැතිව එකී සමුපකාර සමිතියේ සේවයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ එකී වර්ෂ.....................ගතවීමට ප්‍රථම විෂමාචාර හෝ නොසැළකිලිමත් බව නිසා එකී පුහුණුව ලබන්නාගේ සේවය සමුපකාර සමිතිය විසින් නතර කරනු ලබුවහොත් හෝ පාඨමාලාව හදාරන කාලය තුළ එකී පුහුණුව ලබන්නාට ගෙවන ලද වැටුප් හා අනිකුත් සියළුම මුදල්ද වන්දි මුදල්ද ඔහු / ඇය විසින් එකී සමුපකාර සමිතියට ගෙවිය යුතුය.

7. මේ ගිවිසුමේ සියළුම කොන්දේසි එකී පුහුණුව ලබන්නා විසින් නිසි පරිදි ඉටු කරන බවටත්, මෙහි සඳහන් ඕනෑම කොන්දේසියක් කඩ කිරීම නිසා එකී සමුපකාර සමිතියට ගෙවන බවටත්, එකී පුහුණුව ලබන්නා ශ්‍රී ලංකා රක්ෂණ නීතිගත සංස්ථාවක් සහිතව විශ්වාස සහතික බැඳුම්කරයට ඇතුළත් විය යුතුය.මෙම බැඳුම්කරය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නීතිගත සංස්ථාවට ගෙවිය යුතු රක්ෂණ වාර මුදල් පුහුණුව ලබන්නා විසින් ගෙවිය යුතුය.

8. ගිණුම් ප්‍රකාශයක් යයි අදහස් කරනු ලබන්නාවූද, එසේම සීමාසහිත.......................................................සමුපකාර සමිතියේ සභාපති විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් සහතික කරනු ලබන්නාවූද, ලියවිල්ලක් වනාහි අත්සන් කිරීම එහි ඇතුළත් වන සහ එහි තබා ඇති අත්සන ඔප්පු කිරීම සඳහා අතිරේක හා වෙනත් සාක්ෂි නොමැතිව ඉහත කී 4,5 හෝ 6 වගන්ති යටතේ එකී සමුපකාර සමිතියකට අයවිය යුතු වූ මුදල සම්බන්ධයෙන් මුල් බැල්මට පිළිගත හැකි සාක්ෂියක් වන බවට මෙයින් ගිවිස ගනු ලැබේ.

9. එකී සමුපකාර සමිතිය විසින් නිකුත් කළ සහතිකයක් වනාහී එම සහතිකයෙහි ඇතුළත් වන කරුණු හෝ එහි ඇති අත්සන් හෝ ඔප්පු කිරීම සඳහා අතිරේක වෙනත් සාක්ෂි නොමැතිව ඉහත 1,2,4 සහ 5 වන වගන්තිවල ඕනෑම කරුණක් සම්බන්ධයෙන් මුල් බැල්මට පිළිගත හැකි සාක්ෂියක් වන බවට මෙයින් ගිවිස ගනු ලැබේ.

10. මීට සාක්ෂි වශයෙන් එකී පුහුණුව ලබන්නා විසින්ද, එකී සමුපකාර සමිතිය යෙනුවෙන් එකී සමුපකාර සමිතියේ සභාපති වන.......................................................විසින් හා ලේකම් වන...........................................විසින්ද මෙහි පහත සඳහන් ස්ථානයේදී හා දිනවලදී මීට අත්සන් තබන ලදී.............................................විසින් ............................................වූ.........................................මස.............වෙනි දින අත්සන් තබන ලදී.

........................................................
පුහුණුව ලබන්නාගේ අත්සන

සාක්ෂිකරුවෝ :

1.

2.

සීමාසහිත..........................................................................සභාපති තැන්පත්............................................
ලේකම් තැන්පත් ...........................................................................විසින් 19............වූ..................මස..........දින අත්සන් තබන ලදී.

ලේකම් මහතාගේ අත්සන
(සමිතියේ නිල මුද්‍රාව)

සභාපති මහතාගේ අත්සන

සාක්ෂිකරුවෝ :-

1.

2.